முழுப் பதிப்புரிமையுடையது /
All Rights Reserved]

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - කොළඹ අධ්‍යාපන කලාපය
மேல் மாகாணக் கல்வித் திணைக்களம் - கொழும்பு கல்வி வலயம்
Western Provincial Education Department - Colombo Educational Zone

**දෙවන වාර ඇගයීම - 2016**
**இரண்டாம் தவணை மதிப்பீடு - 2016**
**Second Term Evaluation - 2016**

| | | |
|---|---|---|
| 7 ශ්‍රේණිය<br>தரம் 7<br>Grade 7 | භූගෝල විද්‍යාව I හා II පත්‍රය<br>புவியியல் வினாத்தாள்-I-II<br>Geography Paper I & II | පැය දෙකයි<br>இரண்டு மணித்தியாலங்கள்<br>*Two Hours* |

## I පත්‍රය

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- පිළිතුරු මෙම පත්‍රයේම ලියන්න.

★ අංක 01 සිට 05 දක්වා ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

1) පෘථිවි භ්‍රමණයට ගත වන කාලය

1. දින 365 කි
2. දින 364 කි
3. දින 07 කි
4. දිනයකි

2) පෘථිවි පෘෂ්ඨයේ ජලයෙන් වැසී ඇති ප්‍රදේශය

1. 90% කි
2. 71% කි
3. 60% කි
4. 29 % කි

3) පෘථිවි ආදර්ශ ගෝලයේ දකුණු අක්ෂාංශ $23\frac{1}{2}^0$ න් දැක්වෙන්නේ

1. සමකයයි
2. මකර නිවර්තනයයි
3. කර්කටක නිවර්තනයයි
4. ආක්ටික් වෘත්තයයි

4) ශ්‍රී ලංකාව ඉන්දියාවෙන් වෙන්වන පටු මුහුදු තීරයේ පළල

1. 25 Km කි
2. 30 Km කි
3. 32 Km කි
4. 40 Km කි

5) දිවයිනේ ප්‍රධාන භූ විෂමතා කලාප ගණන

1. දෙකකි
2. තුනකි
3. හතරකි
4. පහකි

The National e-learning Portal for The General Education

★ අංක 06 සිට 10 දක්වා ඇති වාක්‍ය වලින් කියැවෙන අදහස හරිනම් (√) ලකුණද, වැරදිනම් (×) ලකුණද, ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.

6) පෘථිවි ගෝලයේ මතුපිට වර්ග ප්‍රමාණය වර්ග කිලෝ මීටර මිලියන 510 කි. ( )

7) මුහුදු මට්ටමේ සිට 30 m ට වඩා උසින් යුතු බිම් මධ්‍යම කඳුකරයට අයත්ය. ( )

8) මන්නාරම, හම්බන්තොට වැනි ප්‍රදේශ වල ශුෂ්ක දේශගුණයට අනුරූපීව වැවෙන ශාක දක්නට ලැබේ. ( )

9) මධ්‍යම කඳුකරයේ ප්‍රධාන කඳු පන්ති ගණන හයකි. ( )

10) සිංහරාජ වනය ලෝක උරුමයක් ලෙස නම් කර ඇත. ( )

★ අංක 11 සිට 15 දක්වා ප්‍රශ්න වලට ගැළපෙන පිළිතුර වරහන තුළින් තෝරා තිත් ඉරමත ලියන්න.

11) පෘථිවියේ ධ්‍රැවක විශ්කම්භය .................................... Km කි

1) 12707 2) 12714

3) 12718 4) 12720

12) ලෝකයේ ප්‍රධාන මහාද්වීප ගණන ......................... කි.

1) 8 2) 7

3) 5 4) 4

13) ලොව විශාලතම සාගරය ............................ යි.

1) පැසිපික් සාගරය 2) ඇන්ටාක්ටික් සාගරය

3) අත්ලාන්තික් සාගරය 4) ඉන්දියන් සාගරය

14) විල්පත්තු අභය භූමිය පිහිටා ඇත්තේ .................................... තුළය.

1) තෙත් කලාපීය භූ දර්ශනය 2) වියළි කලාපීය භූ දර්ශනය

3) මධ්‍යම කඳුකර භූ දර්ශනය 4) වෙරළාශ්‍රිත භූ දර්ශනය

15) සාක්ෂරතාව අතින් ශ්‍රී ලංකාව සෙසු දකුණු ආසියානු රටවල් අතුරෙන් දෙවනි වන්නේ .................. පමණි.

1) ඉන්දියාවට 2) පාකිස්ථානයට

3) නේපාලයට 4) මාලදිවයිනට

★ අංක 16 සිට 20 දක්වා ප්‍රශ්න සඳහා "අ" තීරුවට ගැළපෙන පිළිතුරු "ආ" තීරුවෙන් තෝරා අදාළ වරහන තුළ රෝම ඉලක්කම යොදන්න.

| අ | | ආ |
|---|---|---|
| 16) මානව නිර්මිත ලෝක උරුමයකි. | ( ) | i. මීගමු කලපුව |
| 17) ජාතික වන උද්‍යානයකි. | ( ) | ii. කලා ඔය |
| 18) කඩොලාන සුලභව දැකිය හැකිය. | ( ) | iii රීටිගල |
| 19) වියළි කලාපීය භූ දර්ශනයට අයත් ගංගාවකි. | ( ) | iv ගාලු කොටුව |
| 20) ශේෂ කන්දකි. | ( ) | v නමුණුකුල |
| | | Vi මහ ඔය |
| | | Vii විල්පත්තු |

(ලකුණු 2 × 20 = 40)

e තක්සලාව The National e-learning Portal for The General Education

දෙවන වාර ඇගයීම 2016

භූගෝල විද්‍යාව II කොටස

7 ශ්‍රේණිය

උපදෙස් :-

★ පිළිතුරු ලිවිය යුතු මුළු ප්‍රශ්න ගණන පහකි.

1) i) ශ්‍රී ලංකාව ආසන්නයේ පිහිටි දූපත් තුනක් නම් කරන්න. (ලකුණු 03)


ii) පෘථිවි භ්‍රමණය හා පරිභ්‍රමණය පිළිබඳ වාක්‍ය හතරක් ලියන්න. (ලකුණු 04)

iii) පෘථිවිය පූර්ණ ගෝලයක් නොවන බවට ඇති සාක්ෂි දෙකක් ලියා ඉන් එකක් විස්තර කරන්න.

(ලකුණු 05)

2) i) පහත සඳහන් සටහනේ A, B, C අක්ෂර වලින් දක්වා ඇති රේඛා නම් කරන්න. (ලකුණු 03)

රූප සටහන




ii) අක්ෂාංශ හා දේශාංශ ගැන කරුණු හතරක් ලියන්න. (ලකුණු 04)

iii) ලෝකයේ ප්‍රධාන සාගර දෙකක් සහ මහද්වීප තුනක් නම් කරන්න. (ලකුණු 05)

3) i) a. ශ්‍රී ලංකාව පිහිටියේ කුමන මහාද්වීපයේ ද?

b. ශ්‍රී ලංකාව පිහිටි සාගරය කුමක්ද?

c. ශ්‍රී ලංකාව අයත් මුහුදු තීරයේ දුර කොපමණද? (ලකුණු 03)

ii) මධ්‍යම කඳුකරයට අයත් භූ ලක්ෂණ හතරක් නම් කරන්න. (ලකුණු 04)

iii) ශ්‍රී ලංකාවට වැසි ලැබෙන ක්‍රම තුන දක්වා ඉන් එකක් පිළිබඳව විස්තරයක් ලියන්න. (ලකුණු 05)

4) i) ශ්‍රී ලංකාවේ වාසය කරන ජන වර්ග තුනක් නම් කරන්න. (ලකුණු 03)

ii) සංස්කෘතිකක උරුමයේ ප්‍රධාන ප්‍රභේද දෙක නම් කර ඒවාට අයත්

උදාහරණය බැගින් ලියන්න. (ලකුණු 04)

iii) a. අදි වාසී ජනතාව වාසය කරන ප්‍රදේශ දෙකක් සඳහන් කරන්න.

b. ඔවුන්ගේ ජීවන ක්‍රමයේ ලක්ෂණ තුනක් ලියන්න. (ලකුණු 05)

5) i) වියළි කලාපීය භූ දර්ශකයේ පදනම සකස් වීමට බලපා ඇති සාධක තුනක් නම් කරන්න.

(ලකුණු 03)

ii) වියළි කලාපීය භූ දර්ශකයේ දක්නට ලැබෙන ශේෂ කඳු හතරක් නම් කරන්න. (ලකුණු 04)

iii) මධ්‍යම කඳු කර භූ දර්ශකය ආශ්‍රිත ආර්ථික කටයුතු දෙකක් දක්වා ඉන් එකක් පිළිබඳ විස්තර කරන්න. (ලකුණු 05)

6) i) තෙත් කලාපයෙන් ගලා බසින ගංගා තුනක් නම් කරන්න. (ලකුණු 03)

ii) තෙත් කලාපයේ පිහිටි ප්‍රධාන නගර දෙකක් හා නිදහස් වෙළඳ කලාප දෙකක් නම් කරන්න. (ලකුණු 04)

iii) තල් ගස යාපනයේ වැසියන්ට ප්‍රයෝජනවත් වන ආකාර දෙකක් දක්වා ඉන් එකක් පැහැදිලි කරන්න. (ලකුණු 05)

7) i) ශ්‍රී ලංකව වටා පිහිටි දර්ශනිය වෙරළ තීර තුනක් නම් කරන්න. (ලකුණු 03)

ii) වෙරළාශ්‍රිත ප්‍රදේශයේ දක්නට ලැබෙන ආර්ථික කටයුතු හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

iii) මානව ක්‍රියාකාරකම් නිසා ශ්‍රී ලංකාවේ වෙරළ තීරයට සිදුවන හානි අවම කර ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග දෙකක් දක්වා ඉන් එකක් විස්තර කරන්න. (ලකුණු 05)

★ මුස්ලිම් පාසල් සඳහා උපදෙස්

★ දෙවන කොටසට පිළිතුරු ලිවීමේ දී 8 හා 9 ප්‍රශ්න පිළිතුරු ලිවීමට තෝරා ගන්න.


★ පිළිතුරු ලිවිය යුතු මුළු ප්‍රශ්න ගණන පහකි.

8) i) මහද්වීපය ආසන්නයේ හා අභ්‍යන්තර ප්‍රදේශවල පිහිටා ඇති

කුඩා ජල තල මුහුදු ලෙස හැඳින්වේ. එවැනි මුහුදු තුනක් නම් කරන්න. (ලකුණු 03)

ii) පහත දක්වා ඇති ලෝක සිතියමේ A,B,C,D අක්ෂර වලින් දක්වා ඇති දූපත් නම් කරන්න. (ලකුණු 04)

රූප සටහන




iii) a. ශ්‍රී ලංකාවේ ඉන්දියාවෙන් වෙන්වන පටු මුහුදු තීරය කුමක්ද ?

b. ශ්‍රී ලංකාවේ මුළු බිම් ප්‍රමාණය කොපමණද?

c. ශ්‍රී ලංකාවේ දිග කොපමණද?

d. ශ්‍රී ලංකාවේ පළල කොපමණද?

e. ශ්‍රී ලංකාවේ පිහිටා ඇති අක්ෂාංශ සීමාව කුමක්ද? (ලකුණු 05)

9) i) දකුණු ආසියාවට අයත් රටවල් තුනක් නම් කරන්න. (ලකුණු 03)

ii) a. ඉහළ ආයු අපේක්ෂාවක් සහිත දකුණු ආසියාතික රටවල් දෙක නම් කරන්න.

b. සජීවී උපත් 1000 ට මාතෘ මරණ 200 ඉක්මවන දකුණු ආසියාතික

රටවල් දෙක නම් කරන්න. (ලකුණු 04)

iii) ශ්‍රී ලංකාව සමාජීය සංවර්ධනය අතින් ඉහළ මට්ටමක් හිමිකර ගැනීමට

බලපා ඇති සාධක දෙකක් දක්වා ඉන් එකක් පැහැදිලි කරන්න (ලකුණු 05)